# කප් රුකෙන් නිසි පල ලැබීමට නම්

වගා කළ හැකි හැම බිම් අහලක්ම අස්වැද්දීමේ කාලීන අනිවාර්යත්වය පුන පුනා අවධාරණය කරනු ජන මාධ්‍ය වලින් ඇසේ. මේ නම් සංවර්ධන ප්‍රගතිය උදෙසා පියවරක් නොව පැනීමට කැහැපට ගැසෙන දුවැන්ත පිම්මකි. එහෙත් එවන් පිම්මක් පනින්නට පෙර ඇසිය යුතු, විසඳිය යුතු ප්‍රශ්න රැසක් වෙයි.

අලුතින් බිම් වගාවට සැරසෙන්නේ දැනට වගා කෙරෙන බිම්වලින් උපරිම ප්‍රතිලාභ ලැබෙන නිසාද? නූතන වගා බිම්වලින් අපේක්ෂිත කෘෂි නිෂ්පාදනයෙන් අඩක්වත් නොලැබේ. මා එවන් අසුබවාදී මතයක් අවධාරණය කරන්නේ කුමන විද්‍යාත්මක, ආර්ථික හා පාරිභෝගික පදනමක් මත ද?

තේ පොල් රබර් යන ආර්ථික තෙරුවන මත නිර්මිත කෘෂි සංවර්ධන පිළිවෙතක් අනුගමනය කිරීමේ විපාක වශයෙන් වී ගොවිතැන හැර අන් බොහෝ වගාවන් කෙරෙහි උචිතාවධානයක් මෙතෙක් යොමු නොවීය යන මගේ තර්කනයෙන් බලවතුන් කුලප්පු වන්නට බැරි නැත. එහෙත් යථාර්ථය එය නොවේ ද?

## ආර්ථික ප්‍රතිලාභ

මූලික වැවිලි තෙරුවනට යට වූ බිම් වලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන බව මට නම් සක් සුදකි. එසේ නම් ගත යුත්තේ කුමණ නිවාරණ පියවරක්ද?

උක්ත ප්‍රශ්නයේ තේමාව වශයෙන් පොල් වගාව කදිම බව මගේ වැටහීමයි. මන්ද දේශීය ස්වාභාවික පාරිසරික සම්පත් අපතේ යැවීම අරභයා දිය හැකි හොඳම උදහරණය පොල් වගාව බැවිනි.

වර්ග කිලෝ මීටර 65000ක් වූ දිවයිනෙන් වර්ග කිලෝ මීටර් 2430ක් (හෙක්ටයාර් 243000ක්) යට වී ඇත්තේ පොල් වගාවෙනි. එහෙත් ලෙ බිමේ පස, ජලය, වාතය යන ත්‍රිවිධ සගපතෙන් කොපමණක් පොල් වගාව විසින් පරිභෝජනයට ගැනේ ද? කොපමණක් පරිභෝජනය නොකිරීම නිසා අපතේ යත් ද?

රුහුණු විශ්ව විද්‍යාලයේ
උද්භිද විද්‍යා අංශයේ
මහාචාර්ය
**අලවත්තාගොඩ ප්‍රේමදාස**
විසිනි.

මා දන්නා තරමින් දේශීය පොල් වතු වලින් බහුතරය වගා කෙරෙන්නේ ප්‍රධාන වගාව වූ පොල් පමණි. පොල් ගස් අතරේ සෙසු බිම් මුළුමනින්ම පාහේ අපතේ යයි. අතරින් පතර කුඩා පොල් වත්තක අතුරු යටි වගාවක් කෙරෙතත්, බහුතරය එක්කෝ මුඩු බිම් හැති නම් වල් පැලෑටි වදුලින් පිරි බිම් බව කොළඹ සිට මාතර හෝ පුත්තලම දක්වා මුහුදු තීරයේ යන්නකුට නිරීක්ෂණය කළ හැකි යථාර්ථයයි. ඊට හේතුව අවිද්‍යාත්මක අදූරදර්ශී කෘෂිකර්මයක් කරුමයයි. එවන් අදූරදර්ශීත්මයක සමාජාර්ථික, කෘෂිකාර්මික හා පාරිසරික ආපද හා දිගුකාලීන විපාක කවරේ ද?

## පොල් ත්‍රිකෝණය


පොල් ඉතා සරුවට වැඩෙන්නේ වැලි මිශ්‍රිත පසෙහි බව කොළඹ, ගම්පහ, පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවල පොල් ත්‍රිකෝණය හා මුහුදුබඩ පොල් වගා ප්‍රකට කරන සත්‍යයකි. කළාලමය තුරුලියකින් අනාරක්ෂිත නම් එවන් වැලිමය පසක් සෝද පාළු වීම අනිවාර්යය. ගලා යන ජලය විසින් මතුපිට පස් ඉවත් කිරීමේ අනිටු විපාකය ගල් බොරළු මතු වූ නිසරු මුඩු බිමක් බිහි වීමයි. පොල් ගස් අතරේ බිම මුඩු වුවොත්, තුරුළිය කළාලයෙන් තොර වුවොත් මෙවන් හෝදපාළුවක් වැළැක්වීම අසීරුය. ගල් බොරළු මතු වූ මේ බිම පාරිසරික පුනරුත්ථාපනයකට හා ප්‍රතිසංස්කරණයට වසර සිය ගණනක් වත් ගතවනු නියතය. එවන් මුඩු බිමකින් ඇති පලය කුමක් ද?

එවන් හෝද පාළු වූ මුඩු පසින් වට වූ පොල් වගාවක නිෂ්පාදන ඉරණම පොල් ගස්වල කරටි දෙපස බැලීමෙන් පසක් වේ. එක ද ගසක වත් ගෙඩි දෙක තුනකට වඩා නැති බවත්, බොහෝ ගස් නිකම්ම කණාටු වී ඇති බවත් අවධාරණය කළ යුත්තේ මේ යථාර්ථය බොහෝ දෙනා නොතකන බැවිනි.

මුඩු බිමේ පොල් වගාව නිසරු ඇයි? ශාක වර්ධනය සඳහා අත්‍යවශ්‍ය ලවණ හෝදපාළුව නිසා පසින් ඉවත් වේ. ගල් බොරළු ගහන පස සැඩ හිරු රැසින් වියැලෙන්නේ ජල ඌනතාව තවත් උග්‍ර කරමිනි. මෙවන් ජල හා ලවණ ඌනතාවකින් පොල් ගසේ වර්ධනය දුස්සාධ්‍ය ලෙස අඩාල වීම අරුමයක් ද? උක්ත පොල් වත්ත කණාටු සොහොන් බිමක් වී ඇත්තේ ඒ නිසාය. මෙයින් හැඟෙන්නේ කුමක් ද? ගස් අතර පස නිසි ලෙස ආරක්ෂා නොකිරීම පොල් වගාව නිසරු වී පලදාව අඩු වී, සමාජාර්ථික බංකොලොත් බවකට පදනම බව නොවේ ද? මෙය සම්පත් අපතේ යැවීමක් නොහොත් සංහාරයක් නොවේ ද? තවත් බිම් වගා කෙරෙන්නේ මේ තත්ත්වය යටතේ ද?

## කළමණාකරණය

මේ අර්බුදයට තවත් පැත්තක් වෙයි. උචිත කළමනාකරණයක් නොවීමේ අනිවාර්ය විපාක ලෙසින් බොහෝ පොල් වතු වල්බිහි වී නිසරු වන බවට මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක උදහරණ සපයයි. එහි පෙර බිම් සරුවට වැඩී ඇත්තේ පොඩිසිංඤොමරං, ගඳපාන ප්‍රමුඛ විවිධ වල් පැළෑටි ගහන වදුලකි. එවන් වල් බිහිවීමක විපාක කවරේ ද?



ඉතා සරුවට වැඩෙන වල් වදුල විසින් හිරු රැස් මුළුමනින්ම කපා හැරෙන නිසා පස සුරකින කළාල කුරුලියක් නොවැඩේ. පොඩිසිංඤොමරං වදුලක් ඉවත් කිරීමෙන් මේ වින්නැහිය පසක් කර ගත නොහැකිය. කළාලයකින් තොර අනාරක්ෂිත පස සෝදා පාළු වන බව අමුතුවෙන් කිව යුතු ද? එසේය! ඒ යථාර්ථයට බහුතරය අවකණුන් බැවිනි. මීට අමතරව අධි වේගයෙන් වැඩෙන පොඩිසිංඤොමරං, ගඳපාන යනාදී වල් පැළ මකරුන්ගේ තරඟකාරී අවශෝෂණය නිසා ජලය හා ලවණ ඌනතාව තව දුරටත් උග්‍ර වේ. එවන් පොල් වගාවක් කෘෂි ආර්ථික හා පාරිසරික ව්‍යසනයට ගොදුරු වීම අසිරියක් ද?

මෙවන් අභාග්‍යයකට වගකිව යුත්තෝ පොල් වතු හිමියෝයි. ඊට අමතරව ජගත් මාතාව ද හෙනහුරකු වූ බව සත්‍යයකි. 1985/87 සමය තුළදී මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල නියඟයෙන් පොල් ගස් ලක්ෂ 5ක් පමණ විනාශ වූ අතර, එයින් අඩක් පමණ කරාල කඩා වැටී කවන්ධ විය. මේ පොල් වතු බහුතරය ද වල් බිහි වී ඇති බව මගේ වැටහීමයි. යළි පොල් වගාවකට තවමත් අවධානය යොමු නොවූ බැවිනි.

## දුර්භාග්‍ය පිටු දැකීම

අවිද්‍යාත්මක, අදූරදර්ශී කෘෂිකාර්මික පිළිවෙත් හා ස්වාභාවික ව්‍යසන ද දේශීය පොල් වගාව වැනසූ බව උක්ත සටහන හෙළි කරයි. මේ දුර්භාග්‍ය පිටු දැකීමට ගත යුතු පියවර කවරේ ද? ප්‍රතිඵල කෙබඳු විය හැකි ද? මේ පිළිසකර පිළිවෙළට පදනමක් වශයෙන් දූනට කෙරෙන පොල් වගාවේ ආර්ථික ප්‍රතිලාභ මඳක් විමසීම අත්‍යවශ්‍යය.

හෙක්ටයාරයක (අක්කර දෙකහමාරක) බිමක පොල් ගස් 150 ක් වගා කෙරෙතියි ද වසරකට එක ගසකින් ගෙඩි 40 ක් ලැබෙතියි ද සැලකුවොත් (මේ උපකල්පනය අසාධාරණ නොවන්නේ, පොල් ත්‍රිකෝණයේ හැරුණු විට සෙසු ප්‍රදේශවල පොල් වතු ඉතා නිසරු බැවිනි) වර්ග කිලෝ මීටර් 2430 ක් වූ දේශීය පොල් වගාවේ දළ වාර්ෂික අස්වැන්න පොල් ගෙඩි මිලියන 145.8 කි. (මෙ නිෂ්පාදනය නිවැරදි වීම ගණනට අවශ්‍ය නොවේ.) එකක් රුපියල් 5 ගණනේ දළ වාර්ෂික ආදායම රුපියල් මිලියන 729 කි. එනම් හෙක්ටයාරයක ආදායම රුපියල් 30,000 කි. නොහොත් මාසික ආදායම රු. 2500 ක් පමණි. මෙවන් මාසික ආදායමකින් නූතනයේ පවුලකට මසක් යැපීමඅසීරු බව අවධාරණය කළ යුතු නොවේ.

ඒ ආර්ථික පැත්තය. පාරිසරික සම්පත් පරිභෝජනයේ කාර්යක්ෂමතාව කෙබඳු ද? පොල් ගසක මූල පද්ධතිය වර්ග මීටර් 15 ක වපසරියක් තුළ විහිදෙතියි සැලකුවොත් හෙක්ටයාරයක පස් සම්පතින් පොල් වගාවේ මූල පද්ධතිය විසින් පරිභෝජනය කරනු ලබන්නේ වර්ග මීටර් 2250 කට නොවැඩි ප්‍රමාණයකි. හෙක්ටයාරයක් යනු වර්ග මීටර් 10,000 කි. මේ අනුව හැඟෙන්නේ කුමක් ද? හෙක්ටයාරයක පස් සම්පතින් පොල් වගාවට වැය වන්නේ 25%ක් පමණක් යන්න නොවේ ද?

සෙසු සම්පත් 75% කට සිදු වන්නේ කුමක් ද? නිකම්ම අපතේ යැමයි. මීට අමතරව මූල පද්ධතිය විහිදුණ බිමෙන්ද පොඩිසිංඤොමරං බඳු වල් පැළෑටිවල තරඟය නිසා උපරිම සම්පත් පරිභෝජනයට පොල් ගසට අවකාශ නොලැබේ.

කිසියම් බිමක පස් සම්පත් 75% ක්ම අපතේ යාමට ඉඩ හරින සමාජයකට පැතිය හැක්කේ කුමන කෘෂි සංවර්ධනයක් ද? අප මේ රටේ මේ තරමටවත් හිස ඔසොවා සිටීම අසිරියකි යි සැලකීම වැරදි ද?

## තණ වගාව

මේ කෘෂිකාර්මික අවිදූ අඳුර දුරු කොට ආර්ථික අරුණලු උදා කරනු වස් කුමන අතිරේක පියවර ගත යුතු ද? කදිම යටි වගාවක් මඟින් පස සුරැක අමතර ආදායමක් ද ලැබීම අපහසු නොවේ. කුමන වගාවකින් කෙබඳු ප්‍රතිලාභ පැතිය හැකිද?

මෙයට පෙර ද අවධාරණය කළ නමුදු නෙරළු තුරු යට තණ වගාව නොහොත් පොල් ගස් හෙවනේ තණ බිම් වගා කිරීම සමාජාර්ථික හා පාරිසරික මෙන්ම පෝෂණ හා සෞඛ්‍යමය වශයෙන් ද ඉතා කාලෝචිත පියවරක් බව පුන පුනා අවධාරණය කළ යුත්තේ මේ ප්‍රායෝගික යථාර්ථය කෙරෙහි උචිතාවධානය තවමත් ලැබී නැති බැවිනි. දූනට පොල් වතුවල බහුල හීන් පොතු තණ, පොතු තණ, හීන් ඇටෝර යනාදියේ වර්ධක නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන නිසා වඩාත් හොඳින් වැඩෙන Brachiaria බඳු විශේෂවලින් ඵලදායිත්වය වැඩි කිරීම අපහසු නොවේ. පර්යේෂණ මට්ටමින් මෙසේ තණ බිම් සංවර්ධනයට යත්න දරන ලද නමුදු ප්‍රායෝගිකව ඒ ප්‍රවණතාවයට මෙතෙක් අපේ ඇත්තන්ගේ අවධානය යොමු වූ බවක් නොපෙනේ.

හෙක්ටයාරයක පොල් වත්තක සංවර්ධිත තණ බිමකින් ගවයන් 10 දෙනකු වත් පෝෂණය කළ හැකි බව මගේ තක්සේරුවයි. එවන් ගව පට්ටියකින් ලැබිය හැකි කිරි ප්‍රමාණය දේශීය මන්ද පෝෂණය මැඩ පොල් වතු හිමියන්ගේ ආර්ථික වර්ධනයට හේතු නොවේ ද? ගව මළ මූත්‍රවලින් පොල් වතු තවත් සරු නොවේ ද? මී ගවයන් භාවිතයෙන් නම් මේ පස සරු වීම වඩාත් ක්‍රමිකව සිදු වේ.

ආර්ථික ප්‍රතිලාභ කවරේ ද? දෙනක ගෙන් කිරි බෝතල දෙක බැගින් දිනකට බෝතල 10 ක් ලැබේ නම් මාස 5කදී බෝතල 1500 ක් ලැබීම අපහසු නොවේ. බෝතලයක් රුපියල් 10 ක් නම් වාර්ෂික ආදායම රුපියල් 15,000 කි. නෙරළු තුරු යට තණ වගාව රු. 1250 ක පමණ මාසික අමතර ආදායමක් ලැබිය හැකි නොවේද?

## පැඟිරි හා කුරුඳු

තණ වෙනුවට පැඟිරි වගා කිරීමෙන්ද හෝදපාළුව වළකා පස සුරකිමින්, අමතර ආදායමක් ද ලැබිය හැකි බව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල අසල කලමැටිය නමැති ගම්මානයේ ඇතැම් ගැමියන් විසින් සාර්ථකව සනාථ කැරුණි බව පෞද්ගලිකව දනිමි. සරුවට තණ නොවැඩෙන බිම්වල මෙසේ පැඟිරි වැවීමෙන් රුපියල් හත්අට දහසක අමතර ආදායමක් හෙක්ටයාරයකින් අවුරුද්දකට ලැබිය හැකි බව ඉතා පහසුවෙන් සිතා ගත හැකිය. නිසරු මුඩු බිම් වලට පැඟිරි ඉතා කදිම වාගවකි.

නිසරු බිම්වල සරුවට වැඩෙන සුළු අපනයන බෝග අතරින් කුරුඳු ප්‍රමුඛතමය. පොල් ගස් අතර මුඩු බිමේ කුරුඳු වගාවෙන් සරු ප්‍රතිඵල ලැබිය හැකි බව මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය අවට ගැමියන් ඇතැමෙකුගේ අත්දැකීමයි. විශේෂයෙන්ම මුහුදුකරයේ උස් බිම් වල පොල් වගාවේ අතුරු බෝගයක් වශයෙන් කුරුඳු කදිමය. හෙක්ටයාරයකින් වසරකට කුරුඳු පොතු කිලෝග්‍රෑම් 500 ක් පමණ ලැබිය හැකි නම් රුපියල් 20,000 ක අමතර ආදායමක් ලැබිය හැකි නොවේ ද? කුරුඳු කොළවලින් තෙල් හිඳීමේ ව්‍යාපාර ඇරඹුවොත් කී දෙනෙකුට රැකියා දිය හැකි ද?

කුරුඳු මෙන්ම සරුවට වැඩෙන අතුරු බෝග වගාවක් වශයෙන් කෝපි වලින් ද පොල් වතුවල පස සුරකිමින් ආර්ථික ප්‍රතිලාභ ද සියයට පනහකින් පමණ ඉහළ නංවා ගත හැකි බව යථාර්ථයයි. හෙක්ටයාරයක කෝපි වගාවෙන අඩු තරමින් කෝපි ඇට කිලෝ ග්‍රෑම් 300 ක් වත් ලැබෙනු නිසැකය.

## කෙසෙල් වගාව

විශේෂයෙන්ම වියළි කලාපයේ පොල් වතුවලට උචිත කදිම යටි බෝගයක් ලෙස කෙසෙල් වලින් සිදුවන පාරිසරික ආර්ථික වාසිය අපමණ බව මගේ හැඟීම යි. සිය පොල් වත්තේ අතුරු බෝගයක් ලෙස කෙසෙල් වගා කිරීමෙන් ඉමහත් ප්‍රතිලාභ ලබන රජයේ නිලධාරීන් කිහිප දෙනකු උඩවලව හා මුරුතවෙල කළ සංචාරයකදී හමු වූ බව මට මතකය. ඔවුන්ගේ පිළිවෙත කුමක් ද?

පොල් ගස්වලට වඩා ආසන්න නොවන පරිදි ක්‍රමිකව කෙසෙල් මොටියන් සිටුවා හොඳින් රැක බලා ගැනීම අපහසු කටයුත්තක් නොවේ. කෙසෙල් රෝපණය කෙරෙන්නේ බක් මහ වැහි නොහොත් අන්තර් මෝසම් සමයේ දීයි. මුළු දිවයිනටම එක සේ වැහි වැටෙන මේ කාලය තුළ වගාවන් ඇරඹීම වඩාත් උචිත පැළවලට දිය දැමීමට අමතර පරිශ්‍රමයක් දැරීම අනවශ්‍ය බැවිනි. වසර දෙකක් ඇතුළත අස්වැන්න නෙළීමට හැකි වනු නිසැකය. අඩු තරමින් කෙසෙල් පඳුරු 250 ක් වත් පොල් හෙක්ටයාරයක සරුවට වගා කළ හැකි නොවේ ද? වසරකට කෙසෙල් කැන් 500 ක් ලැබේ නම් අමතර ආදයම රුපියල් 25,000 ක් නොවේ ද?

කුමාරතුංග මුනිදසයන් විසින් තිහේ දශකයේදී පමණ කුඩා දරුවන් සඳහා රචිත 'ශිෂ්‍ය මාර්ගය' 4 වැනි පොතේ කෙසෙල් පිළිබඳ වූ විද්‍යාත්මක කරුණු බිඳක් මෙහිදී මට සිහි වේ. 'බරට ගත් කල තිරිඟු කෙසෙලට වඩා පෝෂ්‍ය ගුණයෙන් යුක්තය. එහෙත් කෙසෙල් තිරිඟු මෙන් එකසිය තුන් තිස් වාරයක් ද අර්තාපල් මෙන් සූසාලිස් වාරයක් ද ඵලදායක ය. මෙයින් හැඟෙනුයේ තිරිඟු රාත්තලක් හෝ අර්තාපල් රාත්තල් තුනක් හෝ ඉපැදවිය හැකි බිමින් කෙසෙල් රාත්තල් එකසිය තුන් තිසක් උපදවන බවයි. ...අභිනව දම්පතිනට ධන ධාන්‍යයෙන් විපුලත්වය ඇතිවන බවට ලකුණක් වශයෙන් මේ ගස යෙදෙයි. එබඳු ලකුණක් වශයෙන් ගැනීමට කෙසෙල් ගස විශේෂයෙන් ම සුදුසුය. කවර හෙයින් ද? අවුරුද්දකට අක්කරයකින් කෙසෙල් ගෙඩි තිස්පන් දහසක් පමණ ලැබෙයි. දිනකට සියයක් පමණ වෙයි. පසට කිසි පොහොරක් නොයොදම පුරා සත් අවුරුද්දක් මේ ඵල ලැබිය හැකි ය. ගෙඩියක් රුපියලක් වුව ද කෙසෙල් අක්කරයක වාර්ෂික ආදයම රුපියල් 35,000 ක් බව කුමාරතුංගයන්ගේ ගණනයන් හෙළි කරයි. තනි වගාවක් වශයෙන් අක්කරයක වගා කැරෙන කෙසෙල් පඳුරු ප්‍රමාණයට පොල් අක්කර 2 1/2 ක් (හෙක්ටයාරයක්) අවශ්‍ය යැයි සිතීම අවිඳුහුරු නොවේ. ඒ අනුව මුලින් සඳහන් කළ පරිදි නෙරළු තුරු යට රඹ වගාවෙන් හෙක්ටයාරයකට රුපියල් 25,000 ක පමණ අමතර වාර්ෂික ආදයමක් ලැබේ.

මෙවන් රඹ වගාවක පාරිසරික වාසි කවරේ ද? කෙසෙල් ශාකයේ භූගත කඳන් (අල) මුල්, පත්‍ර පාද (කෙසෙල් පතුරු) යන හැමෙකක්ම ජල කඳන් යැයි සැලකිය යුතු තරමටම විශාල ජලය ප්‍රමාණයක් එක් රැස්ව සංචිතව පවතී. එවන් සංචිත ජලය සහිත භූගත කොටස් ආශ්‍රිත පස නිතරම තෙතමනයෙන් යුත් බව කෙසෙල් පඳුරකින් මොටියකු ගලවා ඇති කවරකුට වුව ද අත්දැකීමකි. වියළි කලාපයේ පසට මෙවන් ජල සංචිතයකින් ඉටුවන පාරිසරික මෙහෙවර අපමණය. විශේෂයෙන්ම යාබද පොල් ගස්වලට අවශ්‍ය ජලය පවා කෙසෙල් වලින් පෝෂිත පසෙන් ලැබෙන බව මඳක් සිතන විට පසක් වන යථාර්ථයයි. එපමණද නොවේ. කැන් නෙලා ගත් පසු මවු කඳ කුඩා කැබලිවලට කපා පොල් මුල අසල හාරන ලද කාණුවල තැන්පත් කොට පරඬැල්වලින් වැසීමෙන් ගසට ජලය මෙන්ම ලවන සහිත පොහොරක්ද ලැබේ. නෙරළු තුරු යට රඹ වගාවේ සහජීවික ප්‍රතිලාභ ගැන තවත් පරිකථා කුමට ද?

## අන්නාසි

ගම්පහ හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ඇතැම් පොල් වගාවක යටි බෝග වශයෙන් අන්නාසි හා අපනයනයට උචිත ඩූසිනා විශේෂ ද වගා කරන ලද බව ප්‍රකටය. ඉතා සරුවට වැඩුනු ඩූසිනා වගාවන් වේයන්ගොඩ, හොරගොල්ල, නිට්ටඹුව අවට ප්‍රදේශවල පවත්නා බව අඩු වශයෙන් ඒ අවට නිවැසියෝවත් නොදනිත් ද? ඒ අනුව සිය පොල් වතුවල පස සුරකිමින් අමතර ආදයමක් ලබන්නට යෙසසන් ද නොසිතන්නේ මන්ද?

කලකට පෙර කළුතර දිස්ත්‍රික්කයේ පොල් වතුවල යටි වගාවක් වශයෙන් වැල් දෙඩම් වවන ලද බව මට මතකය. ඒ වගාවට කෙහෙතා ලැබුවේ ඇයි? එද වැල් දෙඩම්වල පැවැති ඉල්ලුම අදත් තිබේ ද? නැති නම් ඒ ඇයි? වැල්දෙඩම්, අන්නාසි බඳු යටි වගාවන්ගෙන් තවත් ආදයම් මාර්ග කීයක් නම් විවෘත කළ හැකි ද? බීම, ජෑම් යනාදිය නිපදවා දේශීය අවශ්‍යතා සපුරා, විරැකියාව මඳකින් මැඩ විදේශීය විනිමය ඉපදවීමට ද මහක් නොපෑදේ ද?

දඹල ව්‍යාප්තිකරණය සඳහා අන්තර් ජාතික දඹල මධ්‍යස්ථානයක් අපට තිබේලු! පොල් වතුවල යටිවගාවක් වශයෙන් දඹල යොද ගත නොහැකිද? දේශීය සම්පතක් වූ මැ කරල් ඊටත් වඩා නරක ද? එවන් රනිල ශාකවලින් පොල් වතුවල පසේ නයිට්‍රජන් ඌනතාව දුරු වීමට රුකුලක් ද නොලැබේ ද?

පොල් වතු වටා ඇති වැටේ පැල ඉණි අතරට පුවක්, මැහෝගනි, ඇස්ටෝනියා, බඳු තනි කෙලින් උසට වැඩෙන ශාක වැවීමෙන් වැට ශක්තිමත් වී, අමතර ආදයම් මඟක් ද විවෘත වේ. හෙක්ටයාරයකට හරි හතරැස් ඉඩමක ඇති මීටර 400 ක වැටෙහි අඩු තරමින් එවන් ශාක 100 ක් වත් සිටුවීම අපහසු නොවේ.

දශක දෙකකට පසු එවන් දැව වගාවක මූල්‍යමය අගය කොපමණ විය හැකිද?

මෙවන් අතුරු, වගා අපමණ ඇති බව මඳක් විමසා බැලීමේදී පසක් වන යථාර්ථයයි. එහෙත් මෙතෙක් මවිසින් සඳහන් කරන ලද කරුණු කියවන පාඨකයෙකුට මා සිහින ලොවක මිහල් තනයි යි සිතූනොත් පුදුම නොවෙමි. ඒ අපේ ජාතික අනන්‍යතාවේ ආවේණික ලක්ෂණයක් බැවිනි. පවත්නා පිළිවෙතට නුහුරු කවර මතයක් වූවත් එක් වරම ප්‍රතික්ෂේප කිරීම මෑත යුගයේ සිංහල අපේ අනන්‍යතාවේ කොටසක් වී හමාරය. අප මෙතරම් පසුබෑම ඉතින් අරුම ද?

හොඳා මා සිහින ලොවක මිගුල් කති ද යනු නිර්ණය සඳහා අඩු තරමින් පර්යේෂණයක් කරනු වස්, විවිධ පෙදෙස්වලින් අක්කරය බැගින් තෝරා ගෙන තණ, පැඟිරි, කුරුඳු, කෝපි, කෙසෙල්, වැල් දෙඩම්, දඹල, මැකරල්, අන්නාසි, ඩූසිනා යනාදිය උචිත පරිදි යටිවගාවන් වශයෙන් සිටුවා බලන ලෙස මම අවදියෙන් සිටින්නන්ගෙන් ඉල්ලමි.